# බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

# මධ්‍යම සංස්කෘතික අරමුදල

# පුරප්පාඩු පිරවීම

## අධ්‍යක්ෂ (මුදල්) තනතුර

**සුදුසුකම් හා පළපුරුද්ද :**

**(අ) අධ්‍යාපන සුදුසුකම්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් ගණකාධිකරණය / මූල්‍ය කළමනාකරණය පිළිබඳ උපාධියක් සමග අදාළ විෂය පිළිබඳ පශ්චාත් උපාධියක් හෝ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ හෝ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ හෝ සහතිකලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම

සහ

**(ආ) පළපුරුද්ද**

රජයේ හෝ රාජ්‍ය සංස්ථාවක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකාර මට්ටමේ (ගණකාධිකාරී) තනතුරක අවම වශයෙන් වසර 15 ක පළපුරුද්ද සමග ඉතා යහපත් සේවා වාර්තාවක් තිබීම. (මෙම වසර 15 න් අවම වශයෙන් වසර 05 ක් පශ්චාත් උපාධි සුදුසුකම් හෝ සම්පූර්ණ වෘත්තීය සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව විය යුතුය)

**වැටුප් පරිමාණය :**

රු. 80,295 - 15 x 2270 - 114,345 (HM 1-1 2016)

(මෙයට අමතරව රජය අනුමත මධ්‍යම සංස්කෘතික අරමුදල මගින් ගෙවනු ලබන අධ්‍යක්ෂවරයෙකුට හිමි අනෙකුත් දීමනා හා වරප්‍රසාද හිමිවේ.)

**බඳවා ගැනීමේ ක්‍රමය :**

ව්‍යූහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**පොදු කොන්දේසි :**

**සෑම අපේක්ෂකයෙක්ම,**

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුයි.

(ආ) තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුයි.

(ඇ) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(ඈ) වයස අවුරුදු 30 ට නොඅඩු සහ අවුරුදු 50 ට නොවැඩි විය යුතුය.

**අයදුම් කිරීම**

ඉල්ලුම්පත් එවීමේදී ජීව දත්ත තොරතුරු සහ අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම්, දැනට කරනු ලබන රැකියාව පසුගිය සේවා පළපුරුද්ද ආදිය ඇතුළත් වන සේ තමා විසින්ම සකස් කරන ලද ඉල්ලුම් පත්‍රයක් එවිය යුතුය. ඔබගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ඔබ හොඳින් හඳුනන ඥාතීන් නොවන පිළිගත හැකි පුද්ගලයන් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් ද සඳහන් කළ යුතුය. උප්පැන්න සහතිකය, අධ්‍යාපන හා වෘත්තීමය සහතික, පළපුරුද්ද පිළිබඳ සහතිකවල සහතික කරන ලද ඡායා පිටපත් ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය. දැනට රජයේ හෝ ව්‍යවස්ථාපිත ආයතනයක සේවය කරන්නේ නම් ආයතන ප්‍රධානියා මගින් ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුතුය. සහතික වල පිටපත් නොමැති සහ දී ඇති උපදෙස් අනුව ඉදිරිපත් නොකරන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2020.12.24 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ **අධ්‍යක්ෂ ජනරාල්, මධ්‍යම සංස්කෘතික අරමුදල, දෙවන අදියර, 04 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් බහා එවන කවරයේ වම් කෙළවරෙහි **අයදුම් කරන තනතුර** පැහැදිලිව සටහන් කර එවීමට පියවර ගත යුතුය. නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**අධ්‍යක්ෂ ජනරාල්,**

**මධ්‍යම සංස්කෘතික අරමුදල.**